# ලෝකාලෝකය

2013 අප්‍රේල් - මැයි

ජීවත්ව සිටින තැනැත්තා මළවුන් අතරේ
නුඹලා සොයන්නේ මක්නිසාද?
යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගුටුණුසේක
( ලූක් 24 : 5-6 )



ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය, 7 විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 6.

# පාස්කු මන්නා



පාස්කු කාලය තුල අපගේ අවධානය විශේෂයෙන් යොමු වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දුක්විදීම, කුරුසිපත්වීම මරණය හා මළවුන්ගෙන් නැවත නැගිටීම කෙරෙහි නිසා, ඒ පිළිබඳව ඇති සත්‍යතාවය දේව වචනය තුලින් සොයා (හෝ) දැනුම අලුත් කර ගැනීම අපට ප්‍රයෝජනවත්ය. එම දැනුම අපගේ ආත්මික ජීවිතයට ආශිර්වාදයක් වනු නිසැකයි.

පාස්කුව පිළිබඳව විවිධ දේශණා විවිධ අදහස් සහ මත ඉදිරිපත් කර ඇති නමුත් සැබෑ ඇදහිලිවන්තයින් ලෙස අපි කුමක් කල යුතුද ? එනම් පාස්කුවේ සැබෑ අර්ථය අපගේ ජීවිතයට අදාල කර ගැනීමය. එයින් අපට සැබෑ ප්‍රීතිය, ප්‍රබෝධය, පිබිදීම වැනි ආත්මික ආශීර්වාද ලබා ගත හැකි වනු ඇත.

පාස්කුව තුලින් අපට ලබා දෙන පණිවුඩය නම් අපගේ පාප උදෙසා යේසුස්වහන්සේ ජීවිතය පූජා කර මරණයට පත්වී තුන්වෙනිදා මළවුන්ගෙන් නැවත නැගිටීමයි. මෙම මළවුන්ගෙන් නැවත නැගිටීමේ ධර්මය අලුත් ගිවිසුම් ඇදහිල්ලේ ප්‍රධාන පදනමයි . එනම් ඇදහිලිවන්තයාගේ විශ්වාසයේ සහ බලාපොරොත්තුවේ මූලික පදනම වන්නේ අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමයි. මෙම ධර්මයේ වැදගත්කම ඉස්මතු කරන තවත් හේතුවක් නම් අලුත් ගිවිසුම පුරාවට වාර 104 ක් නැවත නැගිටීම ප්‍රකාශ කර තිබේ. මෙම හිස් වූ ගුහාව එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්ථානවීම අලුත් ගිවිසුමේ ඇදහිලිවන්තයාගේ පාරට්ටුව සහ මහිමය වේ.

කුරුසියේදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ **"එය අවසන් "** කියා තමන්ගෙ ආත්මය තම පියාණන්වහන්සේට භාර කර මරණයට පත්විය. ඉන් දින තුනකට පසු දෙවියන්වහන්සේ විසින් යේසුස්වහන්සේ මරණයෙන් නැගිටවූ සේක. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටුනේ නැත්නම් අපි අපගේ පාප නිසා සදාකාල විනාශයට යනවා ඇත. එමෙන්ම අපගේ ඇදහිල්ලද නිශ්ඵල එකක් වේ. ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නොනැගිටුණුසේක් නම්, නුඹලාගේ ඇදහීම නිෂ්ඵලය නුඹලා මේ දක්වා නුඹලාගේ පාප වල සිටින්නහුය (1 කොරෙන්ති 15 : 17).

මතෙව් 16 :21 හි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පැවසූ සේක. උන්වහන්සේ මරණයට පත්වී දින තුනකට පසු නැවත නැගිටින බව. මේ ප්‍රාතිහාර්යය සියළු ප්‍රාතිහාර්යයන් අභිබවා ගිය ප්‍රබලම ප්‍රාතිහාර්යයකි.

21 පිටුව බලන්න

# එඬේරුන් , බැටළුවන් සහ යේසුස්ක්‍රිස්තුස් වහන්සේගේ සේවය



දේවසේවකයන් එඬේරුන් ලෙසද ඇදහිලිවන්තයන් බැටළුවන් ලෙසද අපි සාමාන්‍යය ව්‍යවහාරයේ හඳුන්වමු. වර්තමානයේ මේ දෙපාර්ශවයම විසින් ස්වකීය දෙවි පියාණන් වහන්සේගේ නාමය අගෞරවයට පත් කරන අවස්ථා බහුලය.
මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යය වල දෙවියන් වහන්සේ වෙත නින්දාව හා අගෞරවය ගෙන දෙන ප්‍රවෘත්ති වාර්තා දක්නට ලැබේ. ද්වේශයෙන් කරන සමහර ප්‍රකාශයන්ද නොදැනුවත් කමින් පලකරන ලිපි හා ප්‍රවෘත්තිද මේවා අතර වේ.

නානාප්‍රකාර කරුණු කේන්ද්‍ර කොට ගනිමින් කිතුණුවා වෙත විවේචන නිග්‍රහයන් හා අපහාසයන් යොමුවන විට මෙය පීඩා කාලය නිසා ඇතිවූවක් බැව් පවසා ඇඟ බේරා ගන්නා සේවකයන්ද ඇදහිලිවතුන්ද නැතුවාම නොවෙයි. පීඩා කාලය එළඹෙන්නට මත්තෙන් එය ආශාවෙන් භුක්තිවිඳීමට ඇතමෙක් උත්සහ දරයි. පීඩාකාලය තවම පැමිණ නැත. පව්කරුවන්ට පසුතැවිලි වී පව්කමාව ලබා දෙවියන්වහන්සේගේ දරුවකු බවට පත්වීමට තවම අවස්ථාව ඇත. කරුණාවේ කාලය එනම් ශුද්ධාත්මයාණන් වහන්සේගේ අනුග්‍රය තවමත් අප සමඟය. අප පසුකරන කරුණාවේ යුගය අවසන් වන්නේ එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වළාකුළු මතට පැමිණ තම සභාව ඔසවා ගැනීමෙන් පසුවය. දේව වචනය අසන්නට හා ඉගෙන ගන්නට තවමත් ඉඩ විවරව තිබේ. එහෙත් අද දක්නට ලැබෙනුයේ දේවසේවකයන් හා ඇදහිලිවන්තයන් විසින් සිදු කරන ක්‍රියාකාරකම් කරණකොට ගෙන ඇති කර ගන්න පීඩාවන්ය.

## ශුභාරංචි සේවය තුලින් සිදුවන දේව අපහාසය.

ශුභාරංචිය පැතිරවීමෙහිලා විශාල පිරිසක් නිරත වී සිටින බව පෙනේ. සැබෑ පුහුණුවක් සහ විනයක් සහිත දේව සේවකයන් සිටින්නේ අතළොස්සක් බැව් හොඳින් සොයා බැලුවොත් දක්නට ලැබේ.

සර්වබලධාරී දෙවියන්වහන්සේගේ නාමය ගෞරවයට හා මහිමයට පත් කිරීම තුලින් ශුභාරංචිය ලොවට කිව යුතුව තිබුණද ශුභාරංචිය ප්‍රකාශ කරන්නට ගොස් දෙවියන්වහන්සේගේ නාමය අගෞරවයට පත්වීමේ සිදුවීම් වාර්තා වේ. ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් වූ පසු ලෝකයේ සැමට ශුභාරංචිය ප්‍රකාශ කිරීම

අපගේ වගකීමකි. එහෙත් එය කල යුතු ක්‍රියා පිළිවෙත් තිබේ.

මුදල් ඇඳුම් පැළඳුම් භාණ්ඩ හා භෞතික සම්පත් දෙමින් කිතුදහමට අන්‍යාගමිකයින් හරවා ගන්නා බවට ප්‍රබල චෝදනාවක් පවතී. මේ ආකාරයෙන් ක්‍රියා කරන පිරිස් සත්‍යය වශයෙන්ම සිටිනවාදැයි මම නොදනිමි. ප්‍රිය කිතුණු සහෝදර සහෝදරිය මෙවැනි චෝදනාවක් එල්ල නොවෙන පරිදි ශුභාරංචිය ප්‍රකාශ කිරීමට ඔබ වගබලා ගන්න. එවැනි ක්‍රියාවන් වල යෙදෙන්නෙක් දුටු කල ඊට එරෙහිව කටයුතු කර දෙවියන්වහන්සේට විය හැකි අගෞරවය වලකා ගනිමු.

'' සකල ලෝකයාටම මේ ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා'' යැයි යේසුස්වහන්සේ කීසේක. බලහත්කාරකම් කරමින් මේ ශුභාරංචිය කිසිවකුට පිළිගන්නා ලෙස උන්වහන්සේ කිසිවිටක නොකියූ සේක. ශුභාරංචිය කිසිවකු පිළිනොගන්නේ නම් ප්‍රතිචාර දැක්විය යුතු ආකාරයද උන්වහන්සේ පෙන්වා දී ඇත. '' යමෙක් නුඹලාගේ වචන අසන්නේවත් පිළිගන්නේවත් නැත්නම් ඒ නුවරින් හෝ ඒ ගෙදරින් පිටත්ව යන කල නුඹලාගේ පාදවල දූලි ගසාදමාපල්ලා''.

## කිතුණු සභාව තුළින් ජීවනය හා බලය ගලා නොයෑම

ක්‍රිස්තුස්වහන්සේ උත්ථාන වීමත් සමග බිහිවුණු බොහෝ සභාවන් දේව මහිමය ලොවට ප්‍රකාශ කරන්නාවූ ශුභාරංචි මධ්‍යස්ථාන මෙන් එකල බලවත් විය. එහි සභිකයන් ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම් වලද සහභාගීකමේද රොටි කැඩීමේද යාච්ඥාවේද නොකඩවා පැවතුණු බැව් අපි දේවවචනයේ දකිමු. ( ක්‍රියා 2 : 42 ) එහෙත් වත්මන් සභාව මේ සිව් ආකාර ක්‍රියා පිළිවෙලින් දුරස් වෙමින් පවතී. ඒවා නොඇසීමට හා ඊට කීකරු නොවීමට ඇදහිලිවන්ත පාර්ශවය පෙළඹී තිබේ. සහභාගීකම වෙනුවට තිත්තකම සභාව තුළට ඇතුළු වීම කරණකොට ගෙන සභාව ලෞකික සංවිධානයක් බවට පත් වෙමින් පවතී.

## ඇදහිල්ල

මද ඇදහිලි ඇත්තන් සහ නැත්තන් බවට පත්ව සිටින ඇදහිලිවතුන් නිසාද දෙවියන්වහන්සේ අගෞරවයට පත්වන බව ඔබ නොසිතන්නේද ? ඔබගේ ඇදහිල්ල මදකම හා නැතිකම නිසා ඔබ අන්‍යාගමිකයින්ට සමවීමෙන් දෙවියන්වහන්සේගේ නාමය හෑල්ලුවට ලක්වන බව සිතට ගන්න. රැකියා ප්‍රශ්ණයකදී පවුල් ප්‍රශ්ණයකදී රෝගී තත්වයන්වලදී ඔබ දෙවියන්වහන්සේ තුල ඇදහිල්ල තැබීම වෙනුවට මනුෂ්‍යය උපකාර පතමින් සිටී. රැකියාවක ප්‍රශ්ණ ඇතිවූ විට ඒවා විසදා ගැනීමට ඔබ මනුෂ්‍යයන්ගේ ඊට අදාල බලධාරීන්ගේ පිහිට පතනවාද ? ඇදහිල්ල තුලින් සමාදානය ගෙන ආ හැකිව තිබියදී ඔබගේ පවුල් ප්‍රශ්ණ ලෝකයා වෙතට ගෙන යමින් ඔබ විසඳුම් සොයනවාද? ආර්ථික ප්‍රශ්ණ වලදී නොඇදහිලිවතුන්ට ණය වෙමින් ''ස්වාමීන්වහන්සේ මාගේ එඩේරාය . මට හිඟයක් නොවන්නේය.''

යයි පවසමින් උන්වහන්සේගේ වචනය උපහාසයට ලක්කරනවාද ? මෙසේ කරමින් ස්වාමින්වහන්සේ ධර්මිෂ්ඨ විනිශ්චය කාරයාණෝ . මාගේ දිව්‍යය වෛද්‍යයවරයාය. සදාකාලික එඬේරා යයි හිතට එකඟව පවසන්නට හැකිදැයි සිතන්න.

දේවසේවකයන් ඇදහිල්ල තුලින් තම අවශ්‍යතා ලබා ගත යුතුව තිබේ. එහෙත් ඔවුන් මුදල් හා අදාල භාණ්ඩ සපයන ලෙස ඇදහිලිවතුන්ට බලකරන අවස්ථා තිබේ. මනුෂ්‍යයන්ගේ උපකාර පතන අවස්ථා තිබේ. ඇදහිල්ලේ ජීවිතයක් ඔවුන් තුල නැතිකමින් දෙවියන්වහන්සේට අගෞරව ගෙනදේ. එහෙත් උන්වහන්සේ සියල්ල සපයන බව දැන ඇදහිල්ලෙන් ඔවුන් කටයුතු කල යුතු නොවේද?.
සැබවින් ප්‍රිය කිතුණුව ඔබ මේ ආකාරයෙන් උන්වහන්සේ අගෞරවයට පත්කල යුතු නොවේ. ඇදහිල්ල ඔබට නොමැති නම් ඔබ ඇදහිල්ල ඔබ ඉල්ලා සිටිය යුතුය. ඒ සඳහා යාච්ඥා කළ යුතුය. ඔබ ඇදහිල්ලේ බලවන්තයෙකු කිරීමට උන්වහන්සේ විශ්වාසවන්තව සිටින සේක.

ඇදහිල්ල තුලින් සමාදානයත් සුවයත් ඔබගේ අවශ්‍යයතා සියල්ලත් ලබා ගන්න ඔබ වගබලා ගන්න. මන්ද " සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට පැමිණියේය. යයි ලියා තිබේ. එසේම " මාගේ නාමයෙන් කවර දෙයක් ඉල්ලුවත් ඒ දේ නුඹලාට දෙනුලබන්නේය. ". යයිද උන්වහන්සේ පොරොන්දු වී තිබේ. එසේ හෙයින් ඇදහිල්ල තුලින් බලවත් සෙනඟක් ලෙස ලෝකයා අතර නැගී සිටින්නට කිතුණුවන් වූ අපි නිතරම ප්‍රයත්න දරමු. වර්තමානයේ කිතුණු සේවයේ යෙදී සිටින සහෝදර සහෝදරියනි, ඔබගේ ජීවිතය දේව වචනයේ පෙන්වා දී තිබෙන විනය සහ හික්මවීම තුල හැඩ කර ගනිමින් දෙවියන්වහන්සේගේ ගෞරවය ආරක්ෂා වන ආකාරයට තම සේවය උන්වහන්සේට ඉටු කිරීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ උපකාර කරන සේක්වා !

*සංස්කාරක*
*එස්. මෙත්තානන්ද - 077 6044339*

*ලෝකාලෝක සගරාව අන්තර්ජාලයේදී කියවන්න.*
*පිවිසෙන්න !*

**www.christianfellowshipcentre.com**

# නුඹට එක දෙයක් අඩුය



යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මෙලොව ජීවිත කාලයේදී විවිධ මාදිලියේ මිනිසුන් යේසුස්වහන්සේ බැහැදැකීමට පැමිණි බව ශුද්ධ බයිබලයේ ශුභාරංචි පොත්වල සඳහන්ව තිබේ. ඒ අතරින් ඉතා සිත් ගන්නා සුළු චරිතයකි පොහොසත් තරුණ මුලාදෑනියාගේ චරිතය. උන්වහන්සේ මාර්ගයට යද්දී එක්තරා කෙනෙක් දුවගෙන ඇවිත් උන්වහන්සේ ඉදිරියෙහි දණින් හිඳ '' යහපත් ආචාරීන්වහන්ස සදාකාල ජීවනය උරුමකර ගන්නා පිණිස මා විසින් කුමක් කරන්ට දැයි උන්වහන්සේගෙන් ඇසුවේය'' ( මාර්ක් 10:17 ). මෙම දේව වචන කොටසේ සඳහන් පුද්ගලයා වස්තුකාර මිනිසෙකු බව මාර්ක් 10 : 22 හි සඳහන් කර තිබේ. ඔහු යෞවනයෙකු බව සඳහන් වන්නේ මතෙව් 19:20 හි ය. ඔහු මුලාදෑනියෙකු බව ලූක් 18:18 හි ලියැවී තිබේ.

## වැදගත් පැනය

යේසුස්වහන්සේ වෙත පැමිණි මෙම අපූරු පුද්ගලයා '' සදාකාල ජීවනය උරුමකර ගන්නා පිණිස මා විසින් කුමක් කරන්නට ඕනෑ දැයි '' උන්වහන්සේගෙන් ඇසීය. ඔහු ඇසූ පැනය ඉතා වැදගත් එකකි. ඔහු පමණක් නොව මිහිපිට ජීවත්වන සෑම මිනිසකු විසින් ඇසිය යුතු එමෙන්ම පිළිතුරු දැන ගත යුතු පැනය එයයි. ඔහුගේ වස්තු සම්පත් මගින් එම පැනය සඳහා පිළිතුරක් ලබා දී නොතිබුණ බව පෙනේ. ලෞකික දෘෂ්ඨි කෝණයෙන් බලන කල මෙම මිනිසා වාසනාවන්තයෙකි. ඔහුට ඇති තරම් සම්පත් තිබුණි. ගත කලේ ඉතා සුඛෝපභෝගී ජීවිතයකි. සමාජයේ ඔහුට තිබුනේ ඉහල පිළිගැනීමකි. මන්ද ඔහු මිනිසුන් අතර මුළැදෑනි කෙනෙක් බව සඳහන් වේ. මේ සියල්ල භුක්ති විඳීම පිණිස ඔහුට තම ජීවිතයේ දීර්ඝ කාලයක් ඉතිරි වී තිබිණ. මන්ද ඔහු තවම පසු වුයේ යෞවන වියේය. එහෙත් මෙම වාසනාවන්ත තත්වය මගින් ඔහුගේ හදවත තුළ කැකෑරුණු වැදගත් පැනයට පිළිතුරු ලැබී තිබුනේ නැත. ''සදාකාල ජීවනය උරුමකර ගන්නා පිණිස මා විසින් කුමක් කරන්නට ඕනෑද?'' මෙය කියවන ඔබගේ සිත තුලත් එවැනි පැනයක් තිබෙනවාද? එය එසේ නම් එය ඔබගේ ජීවිතයේදී අසන වැදගත්ම පැනය බව ඔබට සහතික කොට කියන්න මම කැමති වෙමි.

## හොඳ චරිතයක්

මෙම යෞවනයාගේ චරිත ලක්ෂණ කිහිපයක් තව දුරටත් සොයා බලමු. ඔහු දුවගෙන

ඇවිත් යේසුස්වහන්සේ ඉදිරියෙහි දණ නැමූ බව මාර්ක් 10 : 17 හි සඳහන්ව ඇත. තමාම මුලැදැනියෙක්ව සිටියදී යේසුස්වහන්සේ ඉදිරිපිට දණ නැමීමට තරම් එතෙම යටහත් පහත් පුද්ගලයෙකු විය. යේසුස්වහන්සේත් තරුණ වයසේ පසුවූ හෙයින් එක් තරුණයෙකු ඉදිරියේ තවත් තරුණයෙකු දණ නැමීම විශේෂ සිද්ධියකි. එහෙත් ඔහුගේ මෙම යහපත් නිහතමානීකම නිසාම ඔහුට සදාකාල ජීවනය ලැබී තිබුනේ නැත. එපමණක්ද නොව දෙවියන්වහන්සේගේ නීති ව්‍යයවස්ථාවේ කරුණු ඔහු විසින් අකුරටම පිළිපැද තිබුණු බවක් පෙනෙන්නට තිබේ. එය ඔහුගේ චරිතය පිළිබඳව අති විශේෂ සහතිකයකි.

## මැලැවුණු මුහුණ

ඉහත කතාවේ එන පොහොසත් තරුණයා යේසුස්වහන්සේගේ වචනය අසා "මුහුණ මැලවී ශෝකයෙන් යන්ට ගියේය" ( මාර්ක් 10 : 22 ). එතැන් පටන් ඔහුගේ ජීවිතය මොන ආකාරයෙන් ගෙවුනා දැයි අප දන්නේ නැත. එහෙත් ඔහුගේ ශෝකයට හේතුවූ සාධක දෙකක් ගැන අපට සිතිය හැකිය. වස්තුව අත් හැරීමට තිබූ අකමැත්ත පළමු වැන්න වන අතර සදාකාල ජීවනය ලබා ගැනීමට නොහැකි වීම දෙවැන්න වේ. මේ මිනිසා දැන් සිටි තත්වය මදකට සිතා බලන්න. සදාකාල ජීවනය ලබාගැනීමේ මාර්ගයත් ඔහුට දැන ගන්න ලැබිණි. ඒ සඳහා ඔහු ගත යුතු පියවර ගැනත් ඔහුට පැහැදිලි කරන ලදී. එහෙත් ඔහු සදාකාල ජීවනය හිමිකර ගත්තේ නැත. පසු දිනෙක හෝ ඔහු තීරණයක් ගෙන යලි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණුණා දැයි අපි නොදනිමු. එහෙත් මෙහිදී අපට අති වැදගත් වූ කරුණ වන්නේ අප එකිනෙකා සදාකාල ජීවනය ලබා ගැනීමයි.

## නුඹට එක දෙයක් අඩුය

ප්‍රිය මිතුර මිතුරිය සදාකාල ජීවනය ලබා ගැනීම පිණිස ඔබට අඩුව තිබෙන්නේ කුමක්ද? මුළු සිතින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහා ගැනීමෙන් සදාකාල ජීවනය උරුම වන බව බයිබලය ඔබට ගෙනෙන ශුභාරංචියයි. උපන්දා පටන් අප කල පාප වලට කමාව ලැබීම පිණිස අපට ඇත්තේ එක මාර්ගයක් පමණි. ඒ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහා ගැනීමයි. **" උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය. පොඩි කරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය" ( යෙසායා 53:5).** " අප පාප වලට නැසී ධර්මිෂ්ඨකමට ජීවත් වන පිණිස යේසුස්වහන්සේ තමන්ගේ ශරීරයෙන් කුරුසි ගස පිටදී අපගේ පාපයන් ඉසුලු සේක" ( 1 පේතෲස් 2 : 24 ).

**" මම ලෝකයේ ආලෝකය වෙමි. මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේය" යැයි යේසුස්වහන්සේ පැවසූ සේක. ( යොහාන් 8 : 12 ) .**

**නෙවිල් ජයසුන්දර**

# යුද්ධය



" මහත් කොල්ලයක් ලබන කෙනෙකු මෙන් මම ඔබගේ වචනයෙහි ප්‍රීති වෙමි " ( ගීතාවලිය 119 : 162 ). කොල්ලයක් ලබන්නට නම් යුද්ධයක් කල යුතුමය. මහත් කොල්ලයක් ලබන්නට නම් මහත් යුද්ධයකින් ජය ගත යුතුය. ශුද්ධ බයිබලයේ පරණ ගිවිසුම පුරාවටම දෙවියන්වහන්සේගේ ජනතාවගේ යුද්ධ ජයගැනීම් සහ කොල්ලයන් බෙදා ගැනීම් ගැන සඳහන් වේ. ( යොෂුවා 6 : 18 1සාමුවෙල් 14 : 30 2ලේඛම් 20 : 25 උදාහරණ කිහිපයකි.)

නමුත් වර්තමානයේ ඇදහිලිවන්තයාගේ යුද්ධය කඩු මුගුරු ගෙන එකිනෙකාට විරුද්ධව නැගී සිටීමක් නොවේ. අද ඇදහිලිවන්තයාට මුහුණ දෙන්නට තිබෙන මහත් යුද්ධය නම් ආත්මික යුද්ධයකි. ඒ අතර බයිබලය කියවීම දේව වචනය අධ්‍යයනය කිරීම හා දේව වචනය මෙනෙහි කිරීම යන දේවල් අපගේ ජීවිතයේ ප්‍රධන සටන්ය.

ඔබ ඔබගේ ජීවිතය ගැන කල්පනා කලොත් මෙම කාරණය ඔබගේ ජීවිතය තුල සත්‍යය බව ඔබටම පෙනෙනු ඇත. දෛනික වැඩ කටයුතු අවසාන කර ගැනීමට පැය 24 ට තව පැය කිහිපයක් තිබුණත් මදි යයි කියන අධික කාර්ය බහුල වත්මන් ඇදහිල්වන්තයන් මහ ඉහලින් මෙම යුද්ධය පරාජය වෙයි. බයිබලය කියවීම, අධ්‍යයනය කිරීම හා මෙනෙහි කිරීම ඇදහිලිවන්තයාගෙන් අහසට පොළව මෙන් දුරස්ව ගිහින්ය. එසේ වීමට හේතුව ඇසූ විට ඔවුන්ගේ පිළිතුර වන්නේ බයිබලය කියවීමට තියා එක තැනක වාඩි වී කෑම කන්නටද ඔවුන්ට වෙලාවක් නැති බවයි. ඇදහිලිවන්ත ඔබ මෙම ප්‍රශ්ණයට මොන විදිහේ උත්තර දුන්නත් දෙවියන්වහන්සේ ඔබගෙන් බලාපොරොත්තුවන්නේ කුමක්දැයි ඔබ දන්නවාද? උන්වහන්සේ ඔබට කොතරම් ප්‍රේම කරනවාද, කෙතරම් ඔබව සලකනවාද ඔබ ගැන උන්වහන්සේගේ සැලැස්ම කුමක්ද යන්න ඔබම උන්වහන්සේගෙන් අසා දැන ගැනීමයි. එනම් නිතිපතා උන්වහන්සේ සමඟ කාලය ගත කිරීමයි.

1) - බයිබලය කියවීම නම් දෙවියන්වහන්සේගේ හදවත සොයා දැන ගැනීමයි. එනම් දේවවචනය කියැවීම තුලින් දෙවියන්වහන්සේගේ හදවත කියැවීමයි.

2)- බයිබල් අධ්‍යයනය නම් දේවවචනය වඩා පැහැදිලිව තෝරා ඉගෙන ගැනීමෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙන් වීමට උත්සහ කිරීමයි. දෙවියන්වහන්සේගේ වචනය දැන ගැනීමට වඩා වචනයේ දෙවියන්වහන්සේව දැන ගැනීමයි.

3)- වචනය මෙනෙහි කිරීම නම් යේසුස්වහන්සේගේ චරිතය අප තුලට ආරෝපණය කර ගැනීමට උන්වහන්සේගේ චරිතාලංකාරය සිහිකිරීමයි.

ලෞකික ජීවිතයකට අපිව යොමු වීමට ප්‍රධාන හේතුව නම් අපගේ ජීවිතයේ ක්‍රියාකිරීමට අවශ්‍යය පමණට දේවවචනය නොතිබීමයි. එසේ වන්නේ අපි දේවවචනය නොකියවා සිටීමෙනි. දේවවචනයෙහි ප්‍රීතිමත් වීමට එනම් වචනයෙහි මහත් කොල්ලයක් ලැබී සතුටු වීමට නම් " බයිබල් කියැවීම, අධ්‍යයනය සහ දේව වචනය මෙනෙහි කිරීම " ඇදහිලිවන්තයාට යුද්ධයක්ම විය යුතුය. බයිබලයේ සඳහන් පරිදි දේවවචනය අපගේ ජීවිත වලට ආලෝකයකි. " ඔබගේ වචනය මාගේ පාදයන්ට පහනක්ය. මාගේ මාවතට එළියක්ය "( ගීතාවලිය 119:105). නමුත් මෙම ආලෝකයෙන් අපව දුරස් කරන සතුරෝ තුන් දෙනෙක් සිටී

**1 මාංශය සහ ස්වභාවික සිත**

මහන්සිය, බඩගින්න, නිදිමත වැනි මාංශයේ දුර්වලකම් බයිබලය කියවා දෙවියන්වහන්සේව වඩා දැන ගැනීමෙන් මනුෂ්‍යාව දුරස් කරනවා.

**2 ලෝකය**

රූපවාහිනිය, සිනමා වැනි මායා ලෝකය සැබෑවක් යැයි සිතන තරමටම ඇදහිලිවන්තයා අන්ධ කරයි.

**3 යක්ෂයා**

දේවවචනයට විශාල බියක් දක්වන යක්ෂයා මේ යුද්ධයෙන් ඇදහිලිවන්තයා පරාජය කිරීමට ඕනෑම දෙයක් කිරීමට සූදානමින් සිටිනවා.

නමුත් දෙවියන්වහන්සේ මෙම යුද්ධයෙන් ජයගැනීමට උන්වහන්සේ ඔබව සූදානම් කරනවා ." **ගෝලයන් මෙන් ඇසීමට උන්වහන්සේ උදයක් පාසා පුබුදුවන සේක. මාගේ කන පුබුදුවන සේක. ස්වාමීවූ දෙවියන්වහන්සේ මාගේ කන පුබුදු වන සේක"( යෙසායා 50:4).**

ප්‍රිය මිතුර මිතුරිය ඔබ දවස ගෙවා දැමූ ආකාරය ගැන සිතා බැලුවොත් අවම වශයෙන් පැය තුනක් වත් නිකරුනේ ගත කර තිබෙන බව ඔබට වැටහේවි. යහළුවන් සමග කතා කිරීමට, වැඩ කරන අතර ටික ටික රූපවාහිනිය නැරඹීමට, අත්‍යාවශ්‍යය නොවන ගමන් යෑමට, නමුත් ඔබ ඔබගේ කාලය කළමණාකරණය කිරීමෙන් දවසේ දහසක් වැඩ අතර අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේට උන්වහන්සේට හිමි ස්ථානය දීමට අපට අනිවාර්යයෙන්ම පුළුවන්. ඔබට මෙම මහත් යුද්ධය ජයගෙන මහත් ප්‍රීතියට උරුමකම් කිව හැකියි. දෙවියන්වහන්සේ ඔබව තෝරාගෙන උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ පාප වෙනුවට කුරුසියක මැරෙන්නට සලස්වා නැවත යේසුස්වහන්සේ මරණයෙන් නැගිටවූ බව විශ්වාස කරන්නට තරම් වාසනා වන්තයන් කර තිබෙනවා. එලෙස අපට ප්‍රේම කල උන්වහන්සේගේ හදවත දිනපතාම සොයා දැනගන්නට තරම් ද ඔබ වාසනාවන්තවන්තය මෙම මහත් යුද්ධයෙන් ජයගෙන මහත් ප්‍රීතියක් ලබන්නට ඔබට දෙවියන්වහන්සේගේ කරුණාව ලැබේවා.

බයිබල් අධ්‍යයනයක් ඇසුරිණි

සැකසුම

ශෂිලා වාසනා ද සිල්වා

# ළමා පිටුව



## නිදහස

ආදරණීය පුතේ දුවේ, පසුගිය පෙබරවාරි 04 වෙනිදා අපි 65 වන නිදහස් දිනය සැමරුවා ඔබට මතක ඇති. අපට නිදහස ලැබිලා 2013 වසරේ පෙබරවාරි 04 වන දිනට අවුරුදු 65 ක් වෙනවා. ඔව් පුතේ දුවේ ඒක අපි ජාතියක් හැටියට ලබපු විශාල ජයග්‍රහණයක්, අපේ මව්බිමට නිදහස ලබා ගැනීමට බොහෝ දෙනෙක් ඒ වෙනුවෙන් සටන් කර ජීවිත පුජා කල අය නිසා තමයි යටත් විජිතයක්ව තිබූ අපේ රටට නිදහස ලැබුණේ, දුවේ පුතේ අපේ රට යටත් විජිතයක්ව තිබුණු කාලයේදි මුහුණ දුන් අමාරුකම් පිළිබඳ බොහෝ අය බොහෝ දේ පවසනවා, ඔව් පුතේ දුවේ නිදහසේ අගය අපට දැනෙන්නේ නිදහස අපට අහිමි වූ විටයි, සෑම කෙනෙක්ම නිදහසේ ජීවත් වෙන්න ආසයි, සතුන් පවා කූඩුවක හිරවෙලා ජීවත් වෙනවට වඩා නිදහසේ ජීවත් වෙන්න ආසයි, මේ ලෝකයේ කවුරුත් ආසා තමන්ට ඕනෑ අකාරයට ජීවත් වෙන්නයි. නමුත් අපි එකක් දැන ගත යුතුයි. සෑම දෙයක්ම අපට ඕනෑ ආකාරයට හා සිතේ ආශාවේ හැටියට කරන්න බැරි බව. අපි එකිනෙකා පාලනය කිරීම සඳහා මේ ලෝකයේ නිතී රීති පද්ධතියක් පනවා තිබෙනවා. එය එසේ කර තිබෙන්නේ අපගේ මෙන්ම අන් අයගේ යහපත උදෙසා බව දරුවෝ හැටියට ඔබ සියලු දෙනා මතක තබා ගත ගැනීම වටී.

දැන් හිතන්න පාරක ගමන් කිරිමේදි රථ වහන නීති රීති තිබුනේ නැති නම් කුමක් වෙයිද? රියදුරන් තමන්ට ඕනෑ ඕනෑ විදියට තම තමන්ගේ වාහනය පදවා අනතුරු සිදු කරයි. මිනිසුන්ට කොයි තරම් හානි කරයිද? දුවේ පුතේ මේ ගැනත් හිතන්න පාසැල් ආරම්භ වීමට හා අවසන් වීමට නියමිත වේලාවක් නොතිබුනානම් කුමක් වෙයිද? පාසැල් දරුවන් තමන්ට කැමති කැමති වේලාවට පැසැලට පැමිණ තමන් කැමති වෙලාවට නිවසට යයි. එවිට සියල්ල අවුල් ජාලාවක් බවට පත් වෙයි නේද? අපි මොටර සයිකලයක ගමන්

කරන විට හෙල්මට් එකක් පළඳින්න තිබෙනවා. මොටර් සයිකලයේ යන විට අනතුරක් සිදු වුවහොත් හෙල්මට් එක නිසා අපේ හිස ආරක්ෂා වෙයි. අපි පාර මාරු වෙන විට කහ ඉරෙන් පාර මාරු විය යුතු වෙනවා. අප කහ ඉරෙන් පාර මාරු වන විට පාරේ යන වහන නවත්වා අපට ඉඩ දෙනවා. වාහන රතු සංඥා එළියේදි නතර කල යුතුය. දුවේ පුතේ හිතන්න, අපට මේ අකාරයට සැම දෙයකටම නිතී රීතී හා සීමාවන් දමල තිබෙන්නේ අපේ මෙන්ම අන් අයගේද ආරක්ෂාවටයි. නමුත් සමහර අය මේවා පිළිපදින්නේ නෑ. බොහෝ දෙනෙක් උත්සහ කරන්නේ නිතී පිළිපැදීමට වඩා ඒවා කඩන්න. එමෙන්ම ඔවුන් හිතන්නේ නිතී යනු මහ නපුරු දෙයක් ලෙසය. නිති රීතී කැඩීම මහා වීරකමක් ලෙස සිතන්නෝද අප අතර සිටිති.

ඔව් දුවේ පුතේ අපේ නිවසේ, පැසැලේ, පාරේ තොටේදී විතරක් නොවෙයි, දේව වචනයෙත් අප පිළිපැදිය යුතු නිති රීති සඳහන් කොට තිබෙනවා. එලෙස දෙවියන්වහන්සේ අපට නිතී දී තිබෙන්නේ සැබෑ කිතුණුවන් ලෙස ජීවත් විමටය. උන්වහන්සේගෙ කැමැත්ත අපි සැබෑ දේව දරුවන් ලෙස පිවත් විමයි. අපි බලමු දැන් දේව වචනයේ සඳහන් වන අවවාද කිහිපයක්. 'පියාගේ බස් අසාපන්න', 'මෑණියන් මහලු වූ කල ඇය සුලු නොකරන්න' හිතෝපදේශ පොතේ සඳහන්ව ඇත. එපීස පොතේ මේසේ පවසයි ' දරුවනි නුඹේ මවටත් පියාටත් කීකරුවන්න, එමෙන්ම මෙසේද එහි සඳහන් වේ, නුඹේ මවටත් පියාටත් ගෞරව කරපන්න. මෙවැනි බොහො දේ බයිබලයේ සදහන් වේ, දුවේ පුතේ ඔබත් බයිබලයක් ලබා ගෙන කියවන්න අදම ආරම්භ කරන්න. දෙවියන්වහන්සේගෙ පොත වන බයිබලයේ සඳහන් වන අවවාද සහ අණ පනත් වලට කීකරු වන අයට දෙවියන්වහන්සේ විසින් බහුලව ආශීර්වාද කරන බව උන්වහන්සේ පොරොන්දු වෙනවා. ඉතිං දුවේ පුතේ ඔබට දැන් තෙරනවා නේද? නිති රීති වල තිබෙන වටිනාකම, එසේනම් අපට ලැබී තිබෙන නිදහස අනිසි ලෙස පාවිච්චි නොකර අපේ ආරක්ෂාව පිණිසත්, අන් අයගෙ යහපත උදෙසා හා දෙවියන්නහන්සේගෙ ආශිර්වාද ලබා ගැනීම පිණිස රටේ පවතින නිතීයටත් දේව වචනයේ සඳහන් වන අණ පනත් වලටත් කීකරු වන්න. දෙවියන්වහන්සේ කරුණාව ඔබ සැමට ලැබේවා !

**මෙයට ඔබට ආදරැති**
**තෙල්මා නැන්දා**

# දෙවියන්වහන්සේගේ කැමැත්ත සෙවීමේ මග




තම ජීවිතය පිළිබඳව දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක්දැයි නොදන්නා අය බයිබලයේ එපීස 5 : 17 පදයට අනුව අඥානයින් වේ. ඇදහිලිවතුන් වශයෙන් අපගේ උතුම් වරප්‍රසාදය වන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා දැන ඒ අනුව ක්‍රියා කිරීමයි. අපගේ ප්‍රධාන ආශාව සහ අභිප්‍රාය විය යුත්තේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටුකිරීම විය යුතුය. යමෙකුගේ ජීවිතයේ ප්‍රයෝජනවත්භාවය ප්‍රීතිය හා සේවයේ පැවැත්ම රඳා තිබෙන්නෙ දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව ජීවත්වීම හා ක්‍රියා කිරීම මතය.

මගේ ක්‍රිස්තියානි ජීවිතය ආරම්භයේදී දෙවියන්වහන්සේගේ කැමැත්ත සෙවීම සහ එය ක්‍රියාත්මක කිරීම යනු කුමක්දැයි මම නොදැන සිටියෙමි. එම පාඩම ඉගෙන ගැනීමට මට වසර දෙකක් ගතවුණි. සෑම දිනකම බයිබලය කියවමින් දේව මෙහෙයන්ට සහභාගී වුනත් " ස්වාමීනී ඔබවහන්සේගේ කැමැත්ත වේවායි " යි පුරුද්දක් ලෙස පැවසීමට මම පුරුදුව සිටියෙමි. මේ අතර මා කැනඩාවේ සිටියදී එක් උද්‍යෝගයක කෙනෙක් දුරකථන ඇමතුමක් දෙමින් එක්තරා දේව මෙහෙයකදී දේශණා කරන්නට මා හට හැකිදැයි මගෙන් විමසීය. මොහොතක් සිටින ලෙස ඔහුට පැවසූ මම මගේ දින පොත ගෙන මා හට විවේක තිබේදැයි බලා එම රැස්වීමට සහභාගී විය හැකි බව පැවසුවෙමි. මගේ කථාව ඇසුණු මගේ කාමරයේ සිටි මිත්‍රයෙක් " කොහේ හරි යෑමට හෝ ආරාධනාවක් භාර ගන්නට පෙර ඔබ යාච්ඤා කර තීරණයක් ගන්නේ නැද්ද " යි මගෙන් ඇසීය. " මම යාච්ඤා කිරීමට අවශ්‍යය නැහැ මගේ ප්‍රයෝජනයකට මගේ පෞද්ගලික වැඩකට මම යන්නේ නැහැ. මම යන්නේ දෙවියන්වහන්සේගේ වැඩකට පමණයි". යනුවෙන් මම පැවසුවෙමි. එම ප්‍රශ්ණය ඇසූ නිසා මගේ මිත්‍රයා සමඟ රිදුණු සිතක් ඇතිකර ගත් මම සති දෙකක් පමණ ගත වන තුරු ඔහුට සුභ උදෑසනක් වේවායි පැතුවේද නැත. පසු දිනෙක මම යහපත් සිහිකල්පනාවක් ඇති කර ගෙන මෙසේ සිතන්නට පටන්ගතිමි " දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයන ආකාරය මම දන්නවාද? සමහර විට කොහෙත්ම මම දන්නේ නැහැ." මෙසේ මම ලැජ්ජාවට පත් වුනෙමි. එසේම මා මට මෙසේ පවසා ගතිමි " දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයන ආකාරය දැන ගන්නා තුරු මම කොහේවත් යන්නේ නැහැ."යි තීරණය කල අතර සති දෙකක්ම මම මුහුදු

වෙරළට ගොස් " ස්වාමීනී ඔබවහන්සේගේ කැමැත්ත සොයන ආකාරය මට ඉගැන්වුව මැනව".යි යාච්ඤා කළෙමි. දැන් මට අවශ්‍යය කරන්නේ ස්වාමීන්වහන්සේ මට ඉගැන්වූ දෙය ඔබ සමඟ බෙදා ගැනීමටයි. පහත කරුණු තුන මතකයේ තබා ගන්න.

1) දෙවියන්වහන්සේගේ කැමැත්ත දැන ගැනීමේ වැදගත්කම.

2) දෙවියන්වහන්සේගේ කැමැත්ත සෙවීම සඳහා වූ කොන්දේසි.

3) දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා ගනු ලැබූ බවට සාක්ෂි.

## *දෙවියන්වහන්සේගේ කැමැත්ත දැන ගැනීමේ මහත් වැදගත්කම*

ඔබගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා දැන ක්‍රියාත්මක කිරීම ගැන ඉහත කරුණු සැහැල්ලුවට නොගන්න. ඔබට රජයේ කාර්යාලයකට ගිය විට "හදිසි" යයි රතු ලේබල් අලවන ලද ලිපි ගොනු ඔබ දැක ඇත. රතු ලේබල් වලින් අදහස් කෙරෙන්නේ එම ලිපි ගොනුව පිළිබඳව ඉතා ඉක්මනින් කටයුතු කර අවසන් කල යුතු බවයි. දෙවියන්වහන්සේගේ කැමැත්ත දැන ගැනීම ඒ ආකාරයෙන්ම වැදගත් බව පළමුව තේරුම් ගත යුතුය. ඒ කුමක් උදෙසාද?

### 1 ස්වාමිවූ යේසුස්වහන්සේගේ ජීවිතය ආදර්ශයට ගැනීම පිණිස

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණ ජීවිතයම දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කරමින් ගතවුණි ( යොහාන් 4 : 34 5 : 30 6 : 38 8 : 29 මතෙව් 26 : 39 ). උන්වහන්සේ ඉතා සුළු කාරණා වලදී පවා දෙවියන්වහන්සේගේ කැමැත්තට කීකරු වූ සේක. කානාහි සරණ මංගල්‍යයේදී උන්වහන්සේගේ මෑණියෝ "ඔවුන්ට මුදික පානය නැතැ" යි පැවසුවාය. උන්වහන්සේ ස්ත්‍රිය........මාගේ වේලාව තවම පැමිණුණේ නැතැ" යි පිළිතුරු දුන් සේක. එසේ වුවත් විනාඩි කිහිපයකට පසු උන්වහන්සේ වතුර මිදික පානය බවට පත් කිරීමේ මහා ප්‍රාතිහාර්යය ඉෂ්ඨ කළ සේක. උන්වහන්සේ එසේ කලේ එය දෙවියන්වහන්සේගේ කැමැත්ත බවට පත් වූ විටදීය. අපද දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියා කිරීමෙන් අපගේ ජීවිතයද මහත් ප්‍රයෝජනවත් ලෙස ගත කල හැකි වනු ඇත.

### 2 දෙවියන්වහන්සේගේ සත්‍යය ඉගැන්වීම දැන ගැනීම පිණිස (යොහාන්7:17)

දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් සහ ගැළවීම පිළිබඳ උන්වහන්සේගේ සම්පූර්ණ සැලැස්ම සම්බන්ධව අපගේ අවබෝධය රැඳී පවතින්නේ පියාණන්වහන්සේගේ කැමැත්ත ඉටුකිරීම මතය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ජනතාව ඉදිරියෙහි බොහෝ ප්‍රාතිහාර්යයන් සහ පුදුම ක්‍රියා සිදු කළ සේක. එම ජනයා දෙවියන්වහන්සේගේ කැමැත්ත සෙවීම් ගැන දැන සිටියේ නැත. දෙවියන්වහන්සේගේ කැමැත්ත නොකලහොත් ඔවුන්ට උන්වහන්සේ සහ උන්වහන්සේගේ ක්‍රියා ගැන දැනගන්නට නොහැකිවනු ඇතැයි යේසුස්වහන්සේ ඔවුන්ට පැවසූ සේක. දෙවියන්වහන්සේගේ වචනය තුල ඇති ගැඹුරු අභිරහස් වඩ වඩා තේරුම් ගැනීමටත් එවා අපගේ ජීවිතයට අදාල කරගැනීමට

අපට හැකිවන්නේ දේවකැමැත්ත සොයා එය ඉටු කිරීම මගිනි. අපගේ ජීවිතවල දේව කැමැත්ත සොයා ඉටුකිරීම මගින් දෙවියන්වහන්සේගේ මහෝත්තමභාවය හොඳහැටි අවබෝධ වේ.

## 3 සඵලමත් ජීවිතයක් ගත කිරීම පිණිස ( යොහාන් 5 : 14 )

ප්‍රතිඵලදායක උද්යෝගිමත් යාච්ඤා ජීවිතයක් සෑම ඇදහිලිවන්තයෙකුටම අත්‍යාවශ්‍යය. දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගෙන ඒ අනුව යාච්ඥා කිරීම මගින් අපගේ යාච්ඤා වලට නිසැකවම පිළිතුරු ලැබෙනු ඇත. දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීම නිසා අපට සිදුවීමට තිබෙන අලාභ වලින් අපව බේරෙයි. එමෙන්ම දෙවියන්වහන්සේගෙන් අධික ප්‍රීතිය හා ධෛර්යය අපට ලැබේ. දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව යාච්ඥා නොකරන්නේ නම් අපගේ යාච්ඥා නිශ්ප්‍රයෝජන වෙහෙසීමක් පමණක් බවට පත්වේ.

## 4 දෙවියන්වහන්සේගේ ආදරය හා කරුණාව භුක්ති විඳීම පිණිස ( මතෙව් 12 : 48 - 50 )

දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගෙන ඒ අනුව ක්‍රියා කල විට දෙවියන්වහන්සේගේ ප්‍රේමවන්ත කරුණාව වඩ වඩා අපගේ ජීවිතවල අත්දකින්නට අවස්ථාව ලැබේ. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සහෝදර සහෝදරියෝ උන්වහන්සේ බැලීමට පැමිණි විට උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්සේක. '' මාගේ මෑණියෝ කවුද? මාගේ සහෝදරයෝ කවුරුදැයි කියා .......ස්වර්ගයේ සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන කවුරු නමුත් මාගේ සහෝදරයාත් සහෝදරිත් මෑණියොත්ය''.දෙවියන්වහන්සේගේ කැමැත්ත මත කටයුතු කරන විට උන්වහන්සේගේ ප්‍රේමය ගැඹුරු ආකාරයෙන් අපට දැනෙනෙ අතර උන්වහන්සේගේ අභිමුඛය වඩ වඩා සමීපව අත් දැකීමට හැකිවනු ඇත.

## 5 ආත්මිකව පරිණත වන පිණිස ( රෝම 8 : 14 )

ඉහත පරිච්ජේදය තුල පාවුල් තුමා ඇදහිලිවතුන් සඳහා වචන දෙකක් භාවිතා කරයි. එනම් ''පුත්‍රයෝ'' සහ ''දරුවෝය'' ය. ''පුත්‍රයෝ '' යනු මේරූ ඇදහිලිවන්තයන්ය. අපගේ ආත්මික වර්ධනය රැඳී පවතින්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීම මතය. අපගේ දැනුම හෝ ක්‍රියාකාරකම් මගින් අප ආත්මිකව වර්ධනය නොවන අතර එය සිදුවන්නේ නිතරම දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීම මගිනි. දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව ජීවත්වීම හා ක්‍රියා කිරීම මගින් අප ආත්මික පරිණත භාවයට පත්වේ. එනම් දෙවියන්වහන්සේව දැන ගැනීමෙන් උන්වහන්සේගේ වැඩසිටීම අනුව ජීවත්වීමට ඉගෙන ගනී.

## 6 දෙවියන්වහන්සේගේ බලය භුක්ති විඳින පිණිස ( ගීතාවලිය 29 : 3-9 )

දෙවියන්වහන්සේගේ හඬ ඇසීම මගින් අපට දෙවියන්වහන්සේගේ බලය අත් දැකීමට අවස්ථාව උදාවේ. මේ කාලයේ බොහෝ දෙනා දෙවියන්වහන්සේගේ බලය ලැබුනා යැයි පුරසාරම් දොඩති. දෙවියන්වහන්සේගේ බලය ලබා ගැනීම රැඳී පවතින්නේ දෙවියන්වහන්සේගේ කටහඬ ඇසීමට ඇති

අපගේ කැමැත්ත හා උත්සහය මතයි. අපි දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ තුල අප සිටින විට අපගේ ජීවිත ජයග්‍රාහී ලීලාවෙන් සියළු අභියෝග අභිබවා ඉදිරියට ගලා යන බව පෙනෙන්නට පටන්ගනී. දිනපතා අපි දෙවියන්වහන්සේගේ කටහඬ ඇසීමට දණින් වැටී උන්වහන්සේ ඉදිරිපිට සිටිය යුතුය. බලය දෙවියන්වහන්සේගේ කටහඬ තුල ගැබ්ව තිබේ.

### 7 නිර්භීත ජීවිතයකට මග පෙන්වීම පිණිස (යෙසායා 46:10)

දෙවියන්වහන්සේගේ කැමැත්ත දැන ගැනීමෙන් අපට බියෙන් සහ සැකයෙන් තොර ජීවිතයක් ගතකල හැක. අපගේ අනාගතය පිළිබඳව දෙවියන්වහන්සේගේ සැලසුම අප දන්නෙහි නම් කිසි බියකින් තොරව අනාගතයකට මුහුණ දිය හැකි වන්නේය. එවිට අපගේ අනාගතයට කුමක්වේදැයි යන 'බිය' අපගේ ජීවිතයේ නොපවතිනු ඇත.

## *දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීමට ඇති කොන්දේසි*

### 1 දෙවියන්වහන්සේගෙන් ඉගෙනගැනීමට කැමති විය යුතුය ( ගීතාවලිය 143 : 10 )

දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට ඉගෙනීමට අපි කැමතිවිය යුතුය. මක්නිසාද දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට උන්වහන්සේ අපට බල නොකරයි. උන්වහන්සේ අපගෙන් ආයාචනාද නොකරයි. උන්වහන්සේ සියළු දෙනාටම තමන් කැමති ආකාරයට ජීවත්වීමේ හා ක්‍රියා කිරීමේ නිදහස දී ඇත. එමනිසා දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට ඉගැන්නුව මැනවි කියා අප ඇදහිල්ලෙන් හා ස්ව කැමැත්තෙන්ම දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටිය යුතුය.

### 2 ස්වකැමැත්ත අත් හැරීමට කැමති විය යුතුය ( මතෙව් 26 : 39 )

අප අපගේම කැමැත්තට මිය යෑමට කැමති විය යුතුය. බොහෝවිට සිදු වන්නේ අපි තීරණය කර ඊට අවසර ලබා ගැනීම සඳහා දෙවියන්වහන්සේ වෙතට යෑමයි. අප සියල්ල සැලසුම් කර තීරණ වලට බැස ඊටපසු මෙසේ යාච්ඤා කරති '' දැන් ස්වාමීනී මෙය මාගේ අදහසයි කරුණාකර එය ඉෂ්ඨ කර දෙන්න''. එසේ නොවේ අපි මෙසේ පැවසිය යුතු වෙමු '' ස්වාමීනී මගේ කැමැත්ත නොව ඔබවහන්සේගේ කැමැත්ත සිදුවේවා!'' මේ අරමුණ සඳහා උන්වහන්සේගේ මරණයේ බලය දිනපතා අප තුළට ලබා ගත යුතුය. උන්වහන්සේගේ මරණයේ බලය අප තුළට ලබා ගැනීම මගින් එම මරණය අප අයිතිකර ගැනීම අවශ්‍යය කෙරේ. එසේ අපගේ සියළු ආශාවන් සහ සැලසුම් වලට අපි මිය යා යුතු වෙමු . දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට නම් තම කැමැත්ත මරා දැමිය යුතුය.

### 3 දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට ප්‍රිය විය යුතුය ( ගීතාවලිය 40 : 8 )

දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට අපි මනාපව සිටිය යුතුය. අසම්පූර්ණ සිතකින් යුක්තව දේවකැමැත්ත ඉටුකිරීමට නොහැකිය. දෙවියන්වහන්සේගේ සැලැස්ම

අප සඳහා ඇති උසස්ම සැලැස්ම හෙයින් එය අසම්පූර්ණ සිතකින් භාර ගැනීමට නොහැකිය. උදාහරණ වශයෙන් අපෝස්තුළු පාවුල් තුමාට ආසියාවට යෑමට අවශ්‍යය වුනත් ( ක්‍රියා 16 : 6 ) දෙවියන්වහන්සේ ඔහුට ඉඩ දුන්නේ නැත. ඊට පසු දෙවියන්වහන්සේ ඉතා දුර බැහැර තැනකට යෑමට ඔහුට පැවසු සේක. '' එක හරිම දුරයි මට එහි යෑමට සූදානම් වීමට කල් ගත වේවි '' යයි පාවුල් තුමා කීවේ නැත. ඔහු වහාම ඉතා කැමැත්තෙන් කීකරු වුණේය. තවත් උදාහරණයක් නම් පිලිප්තුමා ගැන ප්‍රවෘත්තියයි. දෙවියන්වහන්සේ ඔහුට කාන්තාරයට යන ලෙස පැවසු සේක.
( ක්‍රියා 8 : 26 ) ඒ වෙලාව වන විට ඔහු බොහෝ ක්‍රියාශීලී ලෙස වැඩ කරමින් සිට ඇත. එසේ වුනත් ඔහු අසම්පූර්ණ සිතකින් නොව ප්‍රීතියෙන් දෙවියන්වහන්සේට කීකරු වී තම වැඩය අතහැර පිටත් විය. දෙවියන්වහන්සේගේ කැමැත්ත කොතරම් අමාරු වුනත් එය ප්‍රීතියෙන් කල යුතුය.

## 4 ප්‍රඥාව කෙරෙහි විශ්වාස නොකිරීම ( හිතෝපදේශ 3 : 5 )

තමන්ගේම නුවණෙහි නොපිහිටන්න. අපගේම අවබෝධය මත කටයුතු කිරීමට අපට නොහැකිය. "ස්වාමීනී මගේ ප්‍රඥාව ඔබවහන්සේය. මම මගේම ප්‍රඥාවෙන් කටයුතු නොකරමි.'' යනුවෙන් අපි පැවසිය යුතුවෙමු. එසේ කළ හැක්කේ ඉතා ශක්තිමත් ඇදහිල්ලක් තිබීමෙනි. දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා එය කිරීමට අවශ්‍යය නම් අපගේ සියළු ඥාන සම්භාරය ඉවත් කර උන්වහන්සේගේ දිව්‍යය ප්‍රඥාව මත රඳා පැවතිය යුතු වෙමු.

## 5 දෙවියන්වහන්සේගේ විශ්වාසවන්ත භාවය විශ්වාස කලයුතුය ( හිතෝපදේශ 3 : 6 )

ඔබගේ සියළු මාර්ග උන්වහන්සේට දන්වන්න. ඉතා කුඩා දෙයක් ගැන වුවද අපි දෙවියන්වහන්සේ වෙතට යා යුතු වෙමු. '' මේක සුළු දෙයක් ඒක කිරීමට අපි දෙවියන්වහන්සේගෙන් ඇසිය යුතු ඇයි? '' යනුවෙන් අපට සිතෙන්නට ඉඩ තිබේ. එහෙත් ඉහත සඳහන් පදයෙන් කියවෙන්නේ අපගේ සියළු මාර්ග උන්වහන්සේට දැන්විය යුතු බවයි. යම් විකිණීමක් හෝ මිළදී ගැනීමක් ගැන හෝ වෙනත් යම්කිසි වැඩක් හෝ කිරීමට පෙර අපි උන්වහන්සේගේ අවසරය ගත යුතුය. අපගේ ස්වාමීන්වහන්සේ මහත් මිලයක් ගෙවා අප මිළදී ගනු ලැබූ සේක. අපගේ කාලය ශක්තිය සහ මුදල් උන්වහන්සේට අයිතිය. කිසිම දෙයක් ගැන අපට අයිතිවාසිකමක් දැක්විය නොහැක. ස්වාමීනී මගේ පුද්ගලික අවශ්‍යයතාවයන් සඳහා මම මේ මුදල් ප්‍රයෝජනයට ගන්නද? යනුවෙන් අපි උන්වහන්සේගෙන් ඇසිය යුතු වෙමු. අපගේ කාලය පිළිබඳව සහ අනෙක් සියළු දේවල් ගැනද එසේ විය යුතුය.

## 6 අපගේ ජීවිත පිරිසිදුව තබා ගත යුතුය. ( රෝම 12 : 1-2 )

අපි අපගේ ජීවිතය පවිත්‍රව සියළු ආකාරයේ පාපයෙන් නිකැළැල්ව තබා ගත යුතු වෙමු. එවිට එය ජීවමාන යාගයක් ලෙස දෙවියන්වහන්සේට පිළිගත හැකිවන්නේය. අපි ලෝකයේ ජනතාවගේ ඇඳුම් විලාසිතා කොණ්ඩා කැපීමේ රටා සහ කථා බහ මෙන්ම ලෝකයාට අයිති පොත් පත් සහ සංගීත

ක්‍රමද අනුකරණය නොකල යුත්තේ ඒවායින් අප අපවිත්‍ර වන හෙයිනි. අප ස්වර්ගීක ජනතාවක් වන නිසා වෙන්වූ ජීවිතයක් ගත කළ යුතුය. මතෙව් 5 : 8 සහ හෙබ්‍රෙව් 12 : 14 පද අනුව අප ශුද්ධ සහ පවිත්‍ර ලෙස ලෝකාකාර ජීවිත රටාවෙන් මිදී දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන ජීවත් වීමට කැමති විය යුතුය.

### 7 සිත අලුත් කර ගැනීමට කැමති විය යුතුය ( රෝම 12 : 2 )

අපට දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීමට අවශ්‍යය නම් අපට අලුත් වුණු සිතක් තිබිය යුතුය. අපි අපගේම මතයෙහි එල්ලී ගෙන නොසිටිය යුතුය. උදාහරණයක් වශයෙන් ඉශ්‍රායෙල් ජනතාව රජෙකු ඉල්ලූහ. රජෙකු ලබා ගත් පසුව ඔවුන්ට සිදුවනදේ පිළිබඳව සාමුවෙල් ප්‍රොපේත තුමා ඔවුන්ට අනතුරු ඇඟවීය. ඒ වනතුරු ඔවුන් රජකෙනෙකු ඉල්ලීමේ අදහසෙහි එල්ලීගෙන සිටි අතර දෙවියන්වහන්සේ ඔවුන් ඉල්ලූ දෙයම ඔවුන්ට ලබා දුන්සේක. යම්කිසි දෙයක් ගැන අපි ස්ථිරව ඉල්ලා සිටියහොත් දෙවියන්වහන්සේ එය අපට දෙන අතර එහි අවසානය අපි පාඩු විඳින්නන් බවට පත් වීමයි. අපගේ සහජ සිත දැඩි ස්වභාවයක් දරණ තම මතයට ගරුකරන තත්වයක පවතින හෙයින් අප තුළ අලුත් කරන ලද සිතක් තිබිය තිබිය යුතුය. දේව වචනයට එකඟ වූ ආකල්පයක් සහිතව ජීවත් වීමට කැමති විය යුතුය.

## *දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගත් බවට ඇති සාක්ෂි*

### 1 හදවතේ සමාදානය (යෙසායා 32:17)

අපගේ දෙවියන්වහන්සේ සමාදානයේ දෙවියන්වහන්සේය.(හෙබ්‍රෙව්13:20-21) දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ස්ව කැමැත්ත ප්‍රථමයෙන්ම එළිදරව් කරන ඕනෑම අවස්ථාවක අපගේ සිත් තුළ ගංගාවක මෙන් වැඩිවී ඉතිරී යන්නාවූ අභ්‍යන්තර සමාදානය පිළිබඳව සංවේදීතාවක් ඇතිවිය යුතුය. යම්කිසි කාරණයක් පිළිබඳව අප දවසේ ඕනෑම අවස්ථාවක යාච්ඤා කරමින් සිටින විට සමාදානය වැඩිවෙමින් පවතීදැයි විමසිලිමත්ව බැලිය යුතුය. එසේනම් එය උන්වහන්සේගේ කැමැත්ත බවට අපට සහතික විය හැකිය. දෙවියන්වහන්සේගේ සමාදානය සහ දෙවියන්වහන්සේ සමඟ සමාදානය අත්පත් කර ගනු ලැබ තිබෙන්නේ ඇදහිලිවන්තයින් විසිනි. එම නිසා දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයාගැනීමට හැකිවන්නේද ඇදහිලිවතුන්ට පමණි. දෙවියන්වහන්සේ තුළ සිටීම අප නොකඩවා පවත්වා ගෙන යන විට සමාදානය වර්ධනය වේ. නොඇදහිලිවතුන්ට දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා දැනගන්නට නොහැක.

### 2 දෙවියන්වහන්සේගේ වචනය ( ගීතාවලිය 119 : 105 )

දේවවචනය තුලින් දෙවියන්වහන්සේ තම කැමැත්ත පෙන්වයි. අපි ශුද්ධ වූ බයිබලය ගෙන දිනයට නියමිත දේව වචන කොටස කියවා ගෙන යන අතරතුරේදී යම් පදයක

කොටසකින් හෝ සම්පූර්ණ පදය තුළින් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ කැමැත්ත තහවුරු කරන සේක. එම දේව වචන කොටස තුලින් දෙවියන්වහන්සේ අපගේ හිතට කථා කරන සේක.

### 3 සභා නායකයන්ගේ හා හවුල් සහෝදර ඇදහිලිවතුන්ගේ එකගතාවය (දානියෙල්2: 17-19 )

අනෙක් ඇදහිලිවතුන් සමඟ යාච්කදාවෙහි යෙදී සිටින විට අපට වැඩිදුරටත් සාක්ෂි ලබා ගත හැකිය. එය කෙසේද යත් දානියෙල් සහ ඔහුගේ මිත්‍රයෝ එක්ව යාච්කදා කල අවස්ථාවේ දී දෙවියන්වහන්සේ දානියෙල්ට සිහිනය සහ එහි අර්ථය එළිදරව් කල ආකාරය මෙනි. එලෙස අපි එක්ව එක සිතකින් යාච්කදා කරන විට දෙවියන්වහන්සේ උන්වහන්සේගේ කැමැත්ත අපට එළිදරව් කරනසේක. සහෝදර ඇදහිලිවතුන් සමඟ නිශ්චිතව යාච්කදා කිරීම මගින් දැනටම එළිදරව් වී තිබෙන දෙවියන්වහන්සේගේ කැමැත්ත පිළිබඳව වැඩිදුර සහතික වීමක් ගෙන දෙන්නේය. අපගේ සුරක්ෂිතතාව වෙනුවෙන් අපට අනෙක් ඇදහිලිවනතුන්ද හවුල් කර ගැනීමට හැක.

### 4 නිර්භීතභාවය ( ක්‍රියා 21 : 10-14 )

යම්කිසි කාරණයක් දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ පවතී නම් අපට ඒ ගැන බියෙන් සැකයෙන් තොරව ඉතා ශක්තිමත් ඇදහිල්ලක් ලබා ගත හැකිවනු ඇත. යෙරුසලමට යන ලෙස දෙවියන්වහන්සේ පැහැදිලිවම අපෝස්තුළු පාවුල් තුමාට පැවසූ සේක. ඔහුගේ ගමන යෑමේදී අගබස් නැමැති ප්‍රොපේතවරයා පාවුල් තුමාගේ ඉගපටිය ගෙන තමාගේ අත් පා බැඳ මෙසේ කීවේය " යුදෙව්වරු මේ ඉග පටිය අයිති වූ මනුෂ්‍යයා යෙරුසලමේදී මේ ආකාරයෙන් බැඳ අන්‍යය ජාතීන්ගේ අත්වලට පාවා දෙන්නේ යැයි ශුද්ධාත්මයාණන්වහන්සේ කියන සේක". මෙසේ කියනු අසා ඇදහිලිවන්තයන් හඬාවැළපෙන්න පටන්ගත්තා.ප්‍රොපේතවරයා පාවුල්තුමාට නොයන ලෙස ඉල්ලා නොසිටි අතර ඇදහිලිවන්තයෝ තමන්ට ඔහු අවශ්‍යය බැවින් නොයන ලෙස ඉල්ලා සිටියහ. නමුත් පාවුල්තුමා උත්තර දෙමින් දෙවියන්වහන්සේ තමන්ට යෑමට පවසා ඇති බවත් දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටුකරන පිණිස තම ජීවිතය පුජා කිරීමට වුවද තමා කැමැත්තෙන් සිටින බවත් පැවසීය. ඔහු තමා දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ සිටින බව සහ ශක්තිමත් ඇදහිල්ලක් යුතුව සිටින බව ඔහු දැන සිටි බැවින් ඔහුට කිසි බයක් නොවීය. අපි දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ සිටිමු නම් අපට භයක් සැකයක් හෝ කනස්සල්ලක් ඇති නොවන්නේය. දෙවියන්වහන්සේ අපගේ සියළු අවශ්‍යතා සපයා දී අප උන්වහන්සේගේ ශක්තියෙන් පුරවනු ඇත.

### 5 ලකුණක් ඉටුවීම ( උත්පත්ති 24:10-14)

සමහර විට යම් ලකුණක් සිදුවන ලෙස නියම කර එය ඉටුවන ලෙසම දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටීමට අපට පුළුවන. නමුත් මෙය හැමවිටම අවශ්‍යය නොකෙරේ. එලියේසර් තම ස්වාමියාගේ පුත්‍රයාට සුදුසු භාර්යාවක් තෝරා ගැනීම පිළිබඳ කාරණයේදී දෙවියන්වහන්සේ

ඉදිරියට සුවිශේෂ ලකුණක් ගෙන ආවේය. සුදුසු පුද්ගලයා සොයාගැනීමට ඔහුට පුළුවන් විය හැකි ආකාරය ඔහු පවා නොදැන සිටියේය. එහෙත් ඔහු ඉතා දිගු ගමන යෑමේ කාර්යය භාරගත් අතර දෙවියන්වහන්සේගේ වෙලාව පැමිණෙන තුරු නැවතී බලා සිටියේය. ඊට පසු ඔහු දෙවියන්වහන්සේ ඉදිරියෙහි දුෂ්කර ලකුණක් තැබුවේය. එහෙත් දෙවියන්වහන්සේ එය ඉටු කර එම තෝරා ගැනීමේ කාරණයේදී උන්වහන්සේගේ කැමැත්ත ස්ථිර කළ සේක. 1938 වසරේ මා පුනා නගරයේ සිටින අතරේදී ස්වාමීන්වහන්සේ මට කථා කර දකුණු ප්‍රදේශයට යන ලෙස කියා සිටිසේක. එවිට " ස්වාමීනී මට උතුරු ඉන්දියාවෙන් ආරාධනා තිහක් ලැබී තිබේ. දැන් ඔබවහන්සේට අවශ්‍යය මා දකුණු ප්‍රදේශයට යෑම නම් මදුරාසියෙන් ලිපියක් ලබා ගැනීමට මට ඉඩ හරින්න" යැයි මම යාච්ඤා කළෙමි. දකුණු ප්‍රදේශයට යෑමේ කාරණය මා ගැන දෙවියන්වහන්සේගේ කැමැත්ත බවට සාක්ෂියක් වශයෙන් එදිනම මදුරාසියෙන් මා හට ලිපියක් ලැබුණි.

**6 දෙවියන්වහන්සේට මහිමය ( හෙබ්‍රෙව් 13:21 )**

ඔබ යාච්ඤා කරමින් සිටින කාරණය හෝ වැඩය තුළින් දෙවියන්වහන්සේගේ නාමය ගෞරවයට පත් කරන කාරණයක් විය යුතුය. ස්වාමීනී මෙම කාරණය තුලින් ඔබ වහන්සේගේ නාමය ගෞරවයට පත් කර ගත මැනව යයි ඔබ කිව යුතුව ඇත. අපට අවශ්‍යය අපගේම නාමය හෝ ප්‍රසිද්ධිය නොව දෙවියන්වහන්සේට මහිමයත් ගෞරවයත් ගෙන දීමයි.එම කාරණය තුලින් දෙවියන්වහන්සේගේ නාමය ගෞරවයට පත් විය යුතුය

**7 අනෙක් අයට ආශිර්වාදය (ක්‍රියා 26:16-19 )**

පාවුල්තුමා දෙවියන්වහන්සේගේ කැමැත්තට සහ සැලැස්මට කීකරු වූ විට ඔහු අන්‍යයන්ට ආශිර්වාදයක් විය. ඔහු සියළු ජනතාවන්ට දෙවියන්වහන්සේගේ සාක්ෂිකාරයෙක් බවට පත් වුවේය. ඒ ආකාරයෙන්ම අපි දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ යම් කිසි දෙයක් කරන විට එය බොහෝදෙනෙකුට ආශිර්වාදයේ උල්පතක් වනු ඇත. එයින් ඔවුන් ශක්තිමත් කරන අතර මුළු සභාවටම ආධ්‍යාත්මික දියුණුවක් උදා කර දෙයි.

මේ සියල්ල එක දවසකින් ඉගෙන ගත නොහැක. දවසින් දවස පුරුදු පුහුණු වීමෙන් ඉගෙන ගැනීමට පුළුවන. උදාහරණ වශයෙන් ආහාර පිසීම එක දවසකින් ඉගෙනීමට නොහැක. ආරම්භයේදී කෑමවට්ටෝරුව දෙස නැවත නැවත බැලුවත් කෑම වල හොඳ රසවත් බවක් නොතිබෙනු ඇත. නමුත් දිනෙන් දින ආහාර පිසීමෙන් රසවත් කෑම සාදාගත හැක. දැන් මම ඔබට මගේ සාක්ෂිය පවසමි. එනම් මොනම කාරණයකදීවත් දෙවියන්වහන්සේගේ කැමැත්ත නොසොයා කිසිම තැනක නොයෑම මගේ ප්‍රතිපත්තිය කර ගතිමි. මෙය ඔබගේ ප්‍රතිපත්තිය කර ගැනීමටද දෙවියන්වහන්සේ ඔබට උපකාර කරන සේක්වා.

එපීස 5 : 17 පදයට අනුව ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ කැමැත්ත සොයන ආකාරය අපට උගන්වා උන්වහන්සේගේ දර්ශණය තුල ප්‍රඥාවන්ත වන පිණිස අපට උපකාර කරන සේක්වා.

**( සහෝදර භක්ත් සිං විසිනි. )**

# ලෝකයේ ආලෝකය



දෙවියන්වහන්සේ ආලෝකය යැයි 1 යොහාන් 1 : 5 දැක්වේ. ආලෝකයේ දෙවියන්වහන්සේ ලෝකය ආලෝකමත් කළ සේක. ඒ ආලෝකමත් ලෝකයේ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාව ජීවත් කළ සේක. නමුත් මනුෂ්‍යයාගේ අකීකරු කම නිසා ඔහු දෙවියන්වහන්සේ ගෙන් වෙන්ව පාප අඳුරේ ජීවත් විය.දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ප්‍රේම කල බැවින් අන්ධකාරයේ ජීවත් වුණ මනුෂ්‍යයාට ආලෝකය ලබා දෙන පිණිස උන්වහන්සේ යේසුස්වහන්සේව මේ ලෝකයට එවූ සේක. යෙසායා 9 : 2 හි " අන්ධකාරයේ ඇවිද්දාවූ සෙනඟ ආලෝකයක් දුටුවෝය". යනුවෙන් සඳහන් වේ. ඒ ආලෝකය නම් යේසුස්වහන්සේය. උන්වහන්සේ මේ ලෝකයේ ජීවත් වෙන කාලයේ එක් අවස්ථාවක මම ලෝකයේ ආලෝකය යැයි තමා ගැනම සාක්ෂි දුන් බව යොහාන් 8 : 12 හි දැක්වේ. යලිත් තම ගෝලයින්ට කථා කොට "නුඹලා ලෝකයේ ආලෝකය" යැයි කී සේක ( මතෙව් 5 : 14 ). මෙය සූර්යයා කෙරෙන් ආලෝකය පරිවර්ථනය වී සඳ මතට පතිත වී සඳ ලෝකයටම එළිය දෙන ලෙස දෙවියන්වහන්සේගෙන් ආලෝකය යේසුස්වහන්සේ වෙතටත් යේසුස්වහන්සේගෙන් අප වෙතටත් ආලෝකය ගලා ආ අයුරු පෙනී යයි. ඒ ආලෝකය අප තුළ තිබෙන පිණිසත් වැඩිවෙන පිණිස අප කුමක් කළ යුතු වෙමුද ? එනම් මතෙව් 6 : 22 හි "ශරීරයේ පහන නම් ඇසය. නුඹේ ඇස පැහැදිලි නම් නුඹේ මුළු ශරීරය එළිය වන්නේය" යනුවෙන් සඳහන් වේ. එබැවින් අප පළමුවෙන් කළ යුතු වනනේ සැබෑ ලෙස අපගේ පව් ගැන පසුතැවිලි වී උන්වහන්සේට කියා දී අපගේ පාප වලට සමාව ලබා ගැනීමයි. එසේම ලූක් 11 : 36 "එනිසා නුඹේ මුළු ශරීරය එහි අඳුරු තැනක් නැතිව එළියෙන් පිරී තිබේ නම් පහන දීප්තිමත්ව බැබලීමෙන් නුඹට එළිය සෙන ලෙසම එක සම්පූර්ණයෙන්ම එළිය වන්නේය" යැයි දැක්වේ. අප දිනපතා බයිබලය කියවීමෙන් සහ යාච්ඤා කිරීමෙන් මේ ආලෝකය වඩා වැඩි කර ගැනීමට අපට හැකි වේ. තවද අප තුළ තිබෙන මෙම ආලෝකය මනුෂ්‍යයන් දකින පිනිස අප කුමක් කළ යුතු වෙමුද?කිසිවෙක් පහනක් දල්වා ඇතුල්වෙන්නන්ට එළිය ලැබෙන පිණිස පහන් රුක උඩ තබනවා මිස යටවත් කුරුණියක් යටවත් නොතබති. එබැවින් උන්වහන්සේ අප තුළ තබා ඇති ආලෝකයේ ඵල අප මනුෂ්‍යයන් ඉදිරියෙහි දක්වමු. ඒවා නම් එපීස 5 : 9 අනුව සියළු ආකාර යහපත්කමත් ධර්මිෂ්ඨකමත් සැබෑකමත්ය. මේවා අප තුළ තිබේ නම් මනුෂ්‍යයන් අපගේ දෙවියන්වහන්සේට ගෞරවය දෙනු ඇත. එපමණක් නොව ඔවුන්ද මෙම ආලෝකයට පැමිණෙනවා නිසැකයි. එමනිසා " මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයේ සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියෙහි බබලාවා" ( මතෙව් 5 : 61 ). ප්‍රිය සහෝදර සහෝදරිය ඔබ යේසුස්වහන්සේ අදහා උන්වහන්සේගේ දරුවකු වී සිටින්නෙහිද? එසේනම් දැන් ඔබගේ වගකීම හා යුතුකම වන්නේ උන්වහන්සේට සේවය කිරීමයි. යහපත් ජීවිත රටාවක් එනම් දේව ගරුබිය සහිත ශුද්ධ ජීවිතයක් ගත කිරීම හා යේසුස්වහන්සේගේ නාමයෙන් අන් මනුෂ්‍යයන්ට යහපත්කම් කිරීම තුලින් දෙවියන්වහන්සේගේ නාමය ගෞරවයට පත් කිරීමට ඔබට හැකියි. එසේ කිරීමට දෙවියන්වහන්සේ ඔබට උපකාර කරන සේක්වා

**රෝහිණී ප්‍රනාන්දු**

2 පිටුවෙන්........

මෙම ප්‍රාතිහාර්යය පිළිගන්න තැනැත්තාට අනෙක් ප්‍රාතිහාර්යයන් පිළිගැනීම අමාරු කාරණයක් නොවේ.

**උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීමට තිබෙන සාක්ෂි**

1) හිස්වූ සොහොන -"ගල සොහොන් ගෙයින් අහකට පෙරලා තිබෙනවා දුටුවෝය. ඔව්හු ඇතුල් වූ කල ස්වාමී වූ යේසුස්වහන්සේගේ ශරීරය නොදුටුවෝය" (ලූක් 24:2,3).

2)දේවදූතයන්ගේ සාක්ෂි - "උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ කී ලෙසම නැගුටුණු සේක"( මතෙව් 28 : 4-6 ),

3)එකවිට දුටු 500කගේ සාක්ෂිය - "ඉන්පසු උන්වහන්සේ එකවිට පන්සියයකට වඩා සහෝදරයන්ට පෙණුනුසේක" (1 කොරෙන්ති 15 : 6).

4)ස්තේපන්ගේ මරණය වූ අවස්ථාවේ දුටු දර්ශණයේ සාක්ෂිය - "බලව, ස්වර්ගය විවර වී තිබෙනවාත් මනුෂ්‍ය පුත්‍රයා දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ නැඟිට සිටිනවාත් මට පෙනේ යැයි කීවේය". - (ක්‍රියා 7: 56).

5)දමස්කය බලා ගමන් කල සාවුල් දුටු දර්ශණයේ සාක්ෂිය -"(ස්වාමීනී ඔබ කවුදැයි ඔහු ඇසීය. උන්වහන්සේද: මම වනාහි නුඹ පීඩා කරන යේසුස්ය"( ක්‍රියා 9 : 5).

6)දින 40 ක් පුරාවට උන්වහන්සේගේ ක්‍රියාවල් සහ බොහෝ දෙනාට දර්ශණය වීමේ සාක්ෂිය -"උන්වහන්සේ වධ වින්ද පසු සතළිස් දවසක් අතරතුරේ ඔවුන්ට පෙනෙමින්ද දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන කාරණා කියමින්ද බොහෝ ඔප්පු සාක්ෂිවලින් තමන්ම ජීවමානව ඔවුන්ට ප්‍රකාශ වූ සේක"(ක්‍රියා 1:3).

7)- ඉතිහාසය පුරාම සිටි අපේ ආදි පියවරු විසින් යේසුස්වහන්සේ ජීවමාන ගැළවුම්කරු ලෙස ඔප්පු කර ඇති ඔවුන්ගේ ජීවිත සාක්ෂි.

**උන්වහන්සේගේ නැවත නැගිටීමේ ශරීරයේ ලක්ෂණ**

1)- මාංශය සහ ඇටකටු ඇති ශරීරයකි - "මාගේ අත් පා බලා, ඒ මමම බව දැන ගනිල්ලා මා අතගා බලාපල්ලා, මක්නිසාද මස් හා ඇට මට තිබෙනවා" ( ලූක් 24 : 39).

2)- මහිමයට පත්වූ ශරීරයකි -උන්වහන්සේගේ තේජසේ ශරීරය...... (පිලිප්පි 3 :21).

3)- නැවත මරණයට පත් නොවන අමරණීය ශරීරයකි- "අපි උන්වහන්සේ සමග මැරුණෙමු නම්, උන්වහන්සේ සමග ජීවත් වන්නෙමු යයි විශ්වාසකරමුව" ( රෝම 6 : 9).

4)- ආත්මික ශරීරයකි-ආත්මික ශරීරයක්ව නැගිටුවනු ලැබේ (1කොරෙන්ති 15 :44).

5 )- ස්වභාවික නීතියට යටත් නොවූ ශරීරයකි -දොරවල් වසා තිබියදී, යේසුස්වහන්සේ ඇවිත් මැද සිට: නුඹලාට සමාදානය වේවා කී සේක (යොහාන් 20 : 19).

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මරණයෙන් නැවත නැගිටුනේ කෙසේද ?**

උන්වහන්සෙගේ නැවත නැගිටීම කෙරෙහි ශුද්ධ වූ ත්‍රිත්වයේ පූර්ණ මැදිහත් වීම හේතු කොට ගෙන උත්තානය ඉෂ්ඨ සිද්ධ වූ සේක.

1) පියාණන්වහන්සේගේ දායකත්වය ක්‍රියා 2 : 23-24 / ක්‍රියා 3 : 15 / ක්‍රියා 5 : 30.

2) පුත්‍රයාණන්වහන්සේගේ දායකත්වය යොහාන් 2 :19 / යොහාන් 10 :18.

3) ආත්මයාණන්වහන්සේගේ දායකත්වය 1 පේතෘස් 3 :18.

**මළවුන්ගෙන් නැවත නැගිටීමෙන් ඇතිවුන ප්‍රතිඵල**

1)- දෙවියන්වහන්සේගේ පැවැත්ම තහවුරු වීම - යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් උත්තාන වුයේ ජීවමාන දෙවියන්වහන්සේ විසින් එම ක්‍රියාව සිදු කල බැවිනි.

2)- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දේව ස්වභාවය තහවුරු වීම.-රෝම 1 : 4

3)- ගැලවීම අවසන් වූ ක්‍රියාවක් බව තහවුරුවීම - යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මැරෙන මොහොතේ ගැලවීමේ ක්‍රියාවලිය සම්පූර්ණ බව පැවසුසේක. උන්වහන්සේගේ උත්තාන වීම එය තහවුරු කල සේක.

4)-යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීම මඟින් උන්වහන්සේ අදහා මිය ගිය සියළු දෙනාගේ මළවුන්ගෙන් නැවත නැගිටීම සහ සභාව ඔසවා ගැනීමේදී නැවත නැගිටීම- 1 තෙසලෝනික 4 :13-18 / තීතස් 2 : 13-24 තහවුරු කරයි.

5)- උන්වහන්සේගේ '' මම නැවත එමි ''යන පොරොන්දුව ඉටු කිරීම සඳහා උන්වහන්සේ සූදානම් වීම.

6)- නැවත නැගිටීමේ බලය අපට අත්දැකීම සඳහා ඇති අවස්ථාව- එනම් අපගේ ගැලවීමත් සමඟ ඇතිවන අලුත් ආකාර ජීවිතයට ප්‍රධාන හේතුව වන නැවත නැගිටුණු අපගේ ස්වාමි වු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ජීවිතය තුල ජීවත් වීම.

ඉතින් ප්‍රිය සහෝදර සහෝදරියනි, අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ ගුරුහරුකම් තුල ගොඩ නැගී එහි හරය ඔබගේ ජීවිතයට අදාල කර ගන්න. ඔබ තවමත් පාපය දුරු කරන බැටළු පැටවාණෝ "(අන්න, ලෝකයේ පාපය දුරුකරන දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ" ( යොහාන් 1 :29 ). වන යේසුස්වහන්සේ තම ජීවිතයට ලබා ගෙන නැත්නම් මෙන්න තවත් කදිම අවස්ථාවක් සහ සුදුසු කාලයක්. උන්වහන්සේ සියල්ලන් වෙනුවට මැරුණේ ජීවත්වන්නන් තවත් තමුන් උදෙසා ජීවත් නොවී, ඔවුන් වෙනුවට මැරී නැවත නැගිටුණා වූ තැනැන්වහන්සේ උදෙසා ජීවත් වන පිණිසය.(2 කොරින්ති 5 : 15 ). එම තීරණය දැන් ඔබ ගත්තා නම් මේ යාච්ඥාව කරන්න.


'' යේසුස්වහන්ස ඔබවහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව විශ්වාස කරමි. මාගේ පාප උදෙසා කුරුසිය මත වන්දිය ගෙවීමේ මරණය විඳි නිසා ස්තුතියි. මාගේ පාප වලට සමාව දී සදාකාල ජීවනයේ දීමනාව මට දුන මැනව. ගැලවුම්කරුවාණන් සහ ස්වාමින්වහන්සේ ලෙස මගේ සිතට වැඩිය මැනව. ඔබවහන්සේගේ දරුවකු බවට පත් කර ගත මැනව.

ආමෙන්

යේසු පිහිටයි !

**එඩ්වඩ් වීරසිංහ**

# උපාලි නන්දන ඉදිරිපත් කරන




ප්‍රහේලිකාව

## හරහට

1 මොහු සාවුල්ගේ පුත්‍රයෙකි.
3 ගැලවීමේ දිනය හෙට නොවේ.
5 යාකොබ් මොහුගේ දේශයේ විදේශියව සිටියේය.
6 යේසුස් වහන්සේගේ පාද මුලයෙහි සිට වචනය ඇසූ ස්ත්‍රියකි.
7 දෙවියන්වහන්සේ යහපත් බව ........... බලා දැනගන්න.
8 නම යන අදහස ගෙනදේ.
9 ආබ්‍රහම්ගේ සහෝදරයෙකි.
11 පොළව විවරව මොහු ගිලගත්බව සඳහන් වේ.
12 නමකි.
15 පහර දීමට මේවා උපයෝගී කරගනී.
16 එළිදරව්පොතේ සඳහන්වන සභාවකි.

## පහළට

1 සුවය ලැබූ කොර මිනිසා මොවුන් දෙදෙනා සමග දේවමාලිගාවට ඇතුල්විය.
2 ස්වර්ගයේ නුඹලාගේ ......... ලියා තිබෙන නිසා ප්‍රීති වෙයල්ලා.
3 පාවුල් තුමාගේ හවුල් සේවකයෙකි.
4 ......... තයෝ ආශිර්වාද ලද්දෝය.
7 ශාස්ත්‍රවන්තයෝ පිදූ පඩුරු වලින් එකකි.
10 හැඬීමේද වැලපීමේද හඬක් මෙහිදී ඇසුනේය.
13 ප්‍රනීත පානයකි.
14 ඊශ්‍රායෙල් සෙනඟ මෝසෙස් සමග රතු මුහුද පසුකර මෙම වනානතරයට ගියේය.

# දුරකථන යාච්ඤා සේවය

සර්වබලධාරී දෙවියන්වහන්සේගේ බලයෙන් යාච්ඤාව කරණකොටගෙන

ඔබගේ ජීවිතයට නව ජීවනයක් ලඟා කර ගත හැක.

ඔබගේ ජීවිතයේ ඇති විවිධාකාර දුක් කම් කටොළු වලට සර්වබලධාරී

දෙවියන්වහන්සේගෙන් පිහිට ලබා නිවිහැනහිල්ලේ ජීවත්වෙන්න

## 0784878941

දෙවියන්වහන්සේගේ පාදපාමුල සිට පාන්දර 4:00 සිට උදෑසන 6:00 දක්වා

දුරකථනයෙන් යාච්ඤා කිරීමේ සේවය.

අදම අපට කතා කර ඔබගේ අවශ්‍ය තාවයට අනුව යාච්ඤා කර ගන්න

(දුරකථන මාර්ගය විවෘතව පවතින්නේ පාන්දර 4:00 සිට

උදෑසන 6:00 දක්වා පමණි)



ඉල්ලාපල්ලා නුඹලාට දෙනු ලැබේ

යේසුස්වහන්සේ කියන සේක.